**බදුල්ල මහා නගර සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

---------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 26 වන දින නගරාධිපතිවරයාට වෙත යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට බදුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු මුද්දර බදු රු.19,263,215 ක් අඩුවෙන් ගිණුම්ගත වීම හේතුවෙන් ජංගම වත්කම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථිර තැන්පතු ගිණුම් දෙකක පොලී ආදායම රු.667,788 ක් වර්ෂයේ ආදායම් ලෙස හා ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මෝටර් රථ හා කරත්ත රු.264,500 ක් ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායකවීමේ ගිණුම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශිය ණය සංවර්ධන අරමුදලේ ණය ශේෂය රු.26,328,386 කින් අඩුවෙන් ගණනය කිරීම හේතුවෙන් ජංගම නොවන වගකීම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) භාවිතයෙන් ඉවත් කළ පුස්තකාල පොත්වල වටිනාකම රු.39,825 ක් ගැලපුම් නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානය ඉදිකිරීමේ කර්මාන්තයේ මූලධන වියදම රු.1,618,488 ක් ප්‍රාග්ධනගත කර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායකවීමේ ගිණුම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) ඉකුත් වර්ෂයේදී මිළදී ගෙන තිබුණු රු.699,333 ක් වූ ප්ලාස්ටික් සම්පීඩන යන්ත්‍රයේ වටිනාකම ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායකවීමේ ගිණුම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට අදාළව බැංකුව විසින් සාවද්‍ය ලෙස රඳවාගෙන තිබුණු බදු මුදල් රු.112,449 ක් සභාවේ ආදායම් හා ලැබිය යුතු ශේෂ ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල වැටුප් ලෙස ගෙවූ රු.35,604,346 ක් පළාත් පාලන දෙපාර්තුමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු ශේෂයක් ලෙස දක්වා නොතිබුණි.

1.3.2 නොසැසඳුනු ගිණුම්

-----------------------

සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන, උපලේඛන, ලෙජර් ගිණුම් හා සාරාංශ වාර්තා සමග සැසඳීමේදී රු.123,395,704 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-------------------------------------**

**(අ) ලැබිය යුතු ගිණුම්**

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.48,931,168 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂය තුළ වර්ෂ 10 ක් කල්පසු වූ හිඟහිටි වරිපනම් රු.22,590,623 ක්, වර්ෂ 07 ක් කල්පසු වූ හිඟහිටි වෙනත් ආදායම් රු.24,114,292 ක් හා වර්ෂ 08 ක් කල්පසු වූ රු.2,226,253 ක් වූ අගරු චෙක්පත් 108 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.153,206,806 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂය තුළ වර්ෂ 05 ක් කල්පසු වූ රු.109,762,352 ක වියදම් ණයහිමියෝ හා වර්ෂ 06 ක් කල්පසු වූ රු.43,444,455 ක ගබඩා ණයහිමියෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**---------------------------------------------------------**

**(අ)** අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.803,111,471 ක් වූ ගිණුම් විෂයයන් 04 විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය/සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ආ) දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.81,794,682 ක් වූ විවිධ පරිත්‍යාග ගිණුමේ ශේෂය සම්බන්ධව කිසිදු තොරතුරක් සභාව සතුව නොතිබුණි.

1.3.6 **අනුකූල නොවීම**

1.3.6.1 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | මහා නගර සභා ආඥාපනත | | |
| | (i)127(1) වගන්තිය | - | 2013 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 30 දින දක්වා කාලපරිච්ඡේදය තුළ ගොඩනැඟිලි ඉදිකිරීම් අයදුම්පත් 946 ක් අනුමත කර තිබුණද, අනුකූලතා සහතික 187 ක් පමණක් නිකුත් කර තිබුණි. |
| | (ii) 218 වගන්තිය | - | 2014, 2015, හා 2016 වර්ෂ වෙනුවෙන් සභාවේ පරිපාලනය පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iii) 229(ඇ) උප වගන්තිය | 2,738,864 | ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා අයවැය ලේඛනය හෝ පරිපූරක ප්‍රතිපාදන අනුමැතියකින් තොරව වියදම් දරා තිබුණි. |
| | (iv) 254 අ (1)උප වගන්තිය | 24,146,745 | සභාවට අයවිය යුතු බදු හා වෙනත් සියලු ගාස්තු, දඩ ආදායම් නාගරික කොමසාරිස්වරයා විසින් අයකර ගෙන නොතිබුණි. |
| | (v) 129 වගන්තිය හා 2017 මාර්තු 17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1778/45 දරන ගැසට්පත්‍රය | | එක් එක් ආයතනය ජනනය කරන කසළවල බර අනුව අදාල ආයතන වලින් කසළ බදු අය කරගෙන නොතිබුණි. |
| (ආ) | (i)1971 අංක 8 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතින් සංශෝධිත 1958 අංක 15 දරන පනතේ 10 වගන්තිය | 362,392 | නියමිත දිනට සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නොගෙවීම හේතුවෙන් සභා අරමුදලින් අධිභාර ගෙවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | (ii) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතේ 6(1)(අ) උප වගන්තිය | 6,905,000 | ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානය ඉදිකිරීම් කර්මාන්තයට අදාළ කොන්ත්‍රාත්කරය කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කර නොතිබුණි. |
| | (iii)1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත 23(අ) වගන්තිය | | ගෝසාතකාගාර සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණු අතර,පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 71 ක් සඳහා වෙළඳ බලපත්‍ර පමණක් ලබාගෙන තිබුණි. |
| (ඇ) | (i) ගෝසාතක ආඥා පනතේ II වන පරිච්ඡේදයේ 4 වගන්තිය | | ගවයකු ඝාතනය කිරීමට පෙර පනතේ "ඇ"ආකෘති පත්‍රය ප්‍රකාරව ඉල්ලුම් පත්‍රයක් මඟින් අවසර ගෙන නොතිබුණි. |
| | (ii) ගෝසාතක ආඥා පනතේ III වන පරිච්ඡේදයේ 22 වගන්තිය | | ගෝසාතකාගාරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර නොතිබු අතර, ගවයන් ඝාතනය කරන ස්ථාන ගෝසාතකාගාරය පාලකයකුගේ හා මහජන සෞඛ්‍ය පරික්ෂක වරයෙකුගේ අධීක්ෂණයට ලක් කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| | (i) 4.5 හා 4.6 වගන්ති | 252,875 | සේවය හැර ගිය හා වැඩ තහනමට ලක්වූ නිලධාරීන් 12 දෙනෙකුගේ ණයශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) ආයතන සංග්‍රහයේ xxi පරිච්ඡේදය හා 2013 අප්‍රේල් 22 දිනැති අංක 5/2013, 2016 අගෝස්තු 29 දිනැති අංක 3/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 337,177 | නිළ ඇඳුම් හා මැහුම් කුලී හිමිකම් නොලබන කර්මාන්ත අධිකාරි/ කාර්මික නිලධාරි යන නිලධාරීන් වෙත නිළ ඇඳුම් දීමනා ලබාදී තිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | (i) මුදල් රෙගුලාසි 104(4) | 996,500 | 2014 ජුනි 17 දින අනතුරට පත් වූ ගිලන් රථයක අලාභහානිය පිළිබඳව පරිපූර්ණ වාර්තාවක් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 454 | - | සෑම කාර්යාලයක්ම භාණ්ඩ වට්ටෝරු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 700(5) | 72,324,287 | සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත 79කට අදාළ ගිවිසුම් පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iv) මුදල් රෙගුලාසි 751 | - | මිළදී ගන්නා හා නිකුත් කරන භාණ්ඩ සම්බන්ධ විස්තර තොග ලේඛන පොතේ වර්ග කර, සටහන් කර නොතිබුණි. |
| | (v) මුදල් රෙගුලාසි 757(2) | 31,650 | නාගරික කොමසාරිස් නිල නිවසේ භාණ්ඩ ඌනතාවයන් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය **(i)** 5.4.4 මාර්ගෝපදේශය | 1,381,000 | 2017 වර්ෂයේදී ප්ලාස්ටික් අබලි ද්‍රව්‍ය ප්‍රතිසංස්කරණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලබාදුන් අත්තිකාරම් සඳහා ලබාගත් සුරක්ෂණය කල් ඉකුත්වී තිබුණු අතර, ඉදිකිරීම් කාලය තුළ වලංගු සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (උ) | 2012 ඔක්තෝබර් 05 දිනැති ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1778/45 ගැසට් පත්‍රය | | සභාව විසින් පනවා ඇති ඝන අපද්‍රව්‍ය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ ප්‍රධාන කරුණු 13 ක් දක්වා තිබුණද, එම කරුණු ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු7,789,058 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.30,102,552 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,051,0000 | 18,629,247 | 10,218,117 | 8,411,129 | 17,538,000 | 19,314,691 | 10,260,870 | 9,053,821 |
| (ii) | කුලී | 24,833,420 | 24,920,095 | 21,900,756 | 3,019,339 | 38,960,114 | 27,359,821 | 24,094,085 | 3,265,735 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 18,260,000 | 14,315,850 | 11,391,975 | 2,923,875 | 10,360,000 | 11,460,885 | 10,749,385 | 711,500 |
| (iv) | වෙනත් ආදායම් | 5,111,5000 | 47,060,996 | 37,268,594 | 9,792,402 | 42,825,000 | 46,076,184 | 37,537,547 | 8,538,637 |
| | එකතුව | 114,718,420 | 104,926,188 | 80,779,442 | 24,146,745 | 109,683,114 | 104,211,581 | 82,641,887 | 21,569,693 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල්කළ ආදායම රුපියල් මිලියන 104.9 ක් වු අතර, වර්ෂය තුල රැස්කළ ආදායම රුපියල් මිලියන 80.7 ක් විය. කෙසේ වුවත් වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 24.1 ක ආදායමක් අයකර ගැනීමට තිබුණු අතර, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම් සියයට 11.9 කින් වැඩිවී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මහා නගර සභා ආඥා පනතේ 261 වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු ගෙවීම් පැහැර හරින අවස්ථා වලදී බදු හිමියන්ගේ චංචල දේපල තහනමට ගැනීම මගින් වරිපනම් අයකිරීමට කටයුතු කළ යුතු වුවද, 2017 ඔක්තෝබර් 31 දිනට වරිපනම් කොට්ඨාශ 15 ක සෝදිසි පරීක්ෂාවේ දී කාර්තු 20 කට අධික කාලයක සිට හිඟව පවතින රු.13,922,535 ක් අය කරගෙන නොතිබුණි.

(ආ) මහා නගර සභා ආඥා පනතේ 254(1) හා 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව සභා සීමාව තුල ඇති සිනමා ශාලාවලින් විනෝද බද්ද අයකර ගත යුතු වුවත්, 2017 දෙසැම්බර් 31 දිනට රු. 1,614,454 ක් හිඟව තිබුණි.

(ඇ) මහා නගර සභා ආඥා පනතේ 230(1) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුළ පිහිටි සියළුම ගොඩනැගිලිවල වාර්ෂික වටිනාකම මත වරිපනම් බදු සැකසීම හා තක්සේරු කිරීම කළ යුතු වුවද, 2011 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා බදුල්ල නගරය තුළ අළුතින් ඉදිකරන ලද ගොඩනැගිලි 277 කට අදාළව වරිපනම් තක්සේරු කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 කුලී

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) බදුදෙන කඩ කාමර 100 ක් 2014 හා 2015 වර්ෂ වලදී තක්සේරුකර තිබුණු අතර, නව තක්සේරු මත ගිවිසුම් ගතවී කුලී අය කරගෙන නොතිබුණි. 1987 වර්ෂයේ තක්සේරුව මත බදු කුලී අය කිරීම හේතුවෙන් 2017 වර්ෂය තුල පමණක් රු. 498,780 ක ආදායම් සභාවට අහිමිවී තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට සියළු ඉදිකිරීම් අවසන් වී තිබුණු බවට අනාවරණය වූ බදුල්ල උමං මාර්ගයේ ඉදිකර තිබූ කඩ කාමර 5 ක් 2017 වර්ෂය තුළ බදු දීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.360,000 ක කඩ කුලී ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

(ඇ) බදුල්ල සේනානායක පිටියේ පවත්වාගෙන යන සභාවට අයත් කිරිහල සඳහා 2016 දෙසැම්බර් 20 දින ඌව පළාත් ප්‍රධාන තක්සේරුකරු මසකට රු. 36,000 ක කුලියක් තක්සේරු කර තිබුණි. එසේ වුවද 2017 දෙසැම්බර් 31 දින දක්වා නව තක්සේරුව මත ගිවිසුම්ගතවී කුලී අය කර නොතිබුණි. ඒ අනුව 2017 දෙසැම්බර් 31 දිනට මාසික වාරික 17 ක වටිනාකම වන රු. 620,142 ක හිඟ කුලියක් සභාවට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේදී කඩා ඉවත් කළ සුවිනීතගම කඩ කාමර 04 ක් 2017 දෙසැම්බර් 31 දින දක්වා සංවර්ධන කටයුතු සිදු නොකර වසා දමා තිබුණු අතර, කඩ කාමර 3ක් සඳහා රු.106,295 ක හිඟහිටි කුලිය බදුකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.5 බලපත්‍ර ගාස්තු

මහා නගර සභා ආඥා පනතේ 247 (අ),(ආ),(ඇ) ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව සභාව විසින් 2017 මාර්තු 31 දිනට පෙර වෙළඳ බලපත්‍ර ලබාගන්නා ලෙස දන්වා තිබුණද වෙළඳ ව්‍යාපාර 563 ක් විසින් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් 2017 වර්ෂය වෙනුවෙන් වෙළඳ බලපත්‍ර ලබාගෙන නොතිබුණු අතර, එම මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු..13,237,018 ක් විය.

### 2.2.7 අධිභාර

මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මවිසින් 1994,2004 සහ 2007 වර්ෂ වලදී පැනවූ අධිභාර අනුව 2017 දෙසැම්බර් 31 දිනට රු.3,835,000 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

මහා නගර සභා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

මහා නගර සභා ආඥාපනතේ 272 වගන්තිය ප්‍රකාරව ත්‍රීවිල් රථ,ලොරි හා වෑන්රථ ගාල් 72 ක රථ වාහන 724 කින් ආදායම් උපයාගෙන තිබුණද අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) **ක්‍රියාකාරි සැලැස්ම**

---------------------

සමාලෝචිත වර්ෂයේදී මහා නගර සභාව විසින් ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඇ) **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

----------------------------------

පහත කරුණු නිරික්ෂණය විය.

(i) කසළ රැස්කිරීමට භාවිතා කරනු ලබන ස්ථානයෙහි රැස්වන ජලය හා කසළ වර්ෂා කාලවලදී බදුලු ඔයට ගලා

(ii) 2017 අගෝස්තු 18 දින වනවිට වර්ෂ 02 කට ආසන්න කාලයක් තුලදී එකතුවූ මෙට්‍රික් ටොන් 26,000 ක පමණ නොදිරන ඝන පොලිතින් ද්‍රව්‍ය කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ වැඩපිළිවෙලක් ආරම්භ කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී ප්ලාස්ටික් ප්‍රතිචක්‍රියකරණ මධ්‍යස්ථානය ඉදිකිරිම වෙනුවෙන් රු.7,618,488 ක් වැය කර තිබුණු අතර, 2017 දෙසැම්බර් 09 දින වනවිට වැඩ නිමකර තිබුණි. එසේ වුවද ව්‍යාපෘතියෙන් බලාපොරාත්තු වූ අරමුණු 2018 සැප්තැම්බර් වනවිටත් ඉටු කර නොතිබුණි.

(iv) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් දීර්ඝ කාලීන වැඩපිළිවෙලක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **පාරිසරික ගැටළු**

------------------

පහත කරුණු නිරික්ෂණය විය.

(i) සෝගාතකාගාරය පවත්වාගෙන යනු ලබන ප්‍රදේශය හා ඒ අවට බඳුළු ඔයෙහි ඉවුර තුළ අනවසර ස්ථිර ඉදිකිරීම් කිහිපයක් විය.

(ii) මහා නගර සභා ආඥා පනතේ 35 හා 56 වගන්ති අනුව ඉඩම් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ,සභාවට අයිති කයිලගොඩ උඩවැල්ල ඉඩම බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් වැලි ගොඩ දැමීම සිදු කරමින් පවතින බැවින්, එය වැලැක්වීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඉ) **තිරසර සංවර්ධන ඉලක්ක**

------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් සකස් කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) 2014 ජුනි 17 දින ගිලන් රථයක් අනතුරට පත්වීම හේතුවෙන් සිදුවූ අලාභය රු.363,420 ක් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේදී සමරුඵලක 15 ක් මිළදී ගැනීම වෙනුවෙන් රු.105,000 ක් පෞද්ගලික සමාගමකට ගෙවා තිබුණු අතර, එම මුදල් වලින් රු.55,000 ක් මේ දක්වා පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 ජුනි 26 දිනැති අංක 18/2015 හා 2015 ජුලි 13 දිනැති අංක 18/2015(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව සක්‍රීය සේවා කාලයක් සහිත නිලධාරීන් වෙත විශේෂ දීමනාව ගෙවිය යුතු වුවත්, අදාල නොවන නිලධාරීයෙකුට 2016 හා 2017 වර්ෂවල මාස 19 ක් සඳහා මසකට රු.3000 බැගින් රු.57,000 ක විශේෂ දීමනාවක් ගෙවා තිබුණි.

(ඈ) 2017 වර්ෂයේදී මහානගර සභා ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ලංසු 03ක් ඉදිරිපත් කර තිබුණු අතර, ලංසු සාධාරණ සමාන ඇගයීමකට ලක් නොකර කොන්ත්‍රාත්කරුවෙකු වෙත ලංසු ප්‍රදානය කර තිබීම හේතුවෙන් සභා අරමුදලට රු.197,831 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඉ) සභාවට අයත් නිලනිවාස 15 ක් සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව නිවාස ශ්‍රේණිගත කිරීම හා වෙන්කර දීම සඳහා කමිටුවක් ස්ථාපනය කිරීමට කටයුතු කර නොතිබුණු අතර, දීර්ඝ කාලයක සිට එකම නිලධාරි කණ්ඩායමකට නිල නිවාස වෙන්කරදීම සිදුකර තිබුණි. පොරොත්තු ලේඛනයේ නම ඇතුළත් නොවන නිලධාරින්ටද නිල නිවාස වෙන්කර දීම සිදුකර තිබුණි.

(ඊ) බදුල්ල සතිපොල භූමියේ හා ගවඝාතකාගාරයේ විදුලිය හා ජලය සම්බන්ධතා විසන්ධි කිරීම හේතුවෙන් එය නැවත ලබා ගැනීම සඳහා රු.57,233 ක් සභා අරමුදලෙන් ගෙවා තිබුණු අතර, බදුකරුවනගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 **අවිධිමත් ගණුදෙනු**

සමලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයේ ඇතුළත් නොවූ රු.8,519,358 ක් සහ කසළ බැහැර කරන ස්ථානය වැඩිදියුණු කිරීම සඳහා වෙන් කරන ලද රු.1,000,000 ක ප්‍රතිපාදන උපයෝගි කරගෙන නගරාධිපතිවරයාගේ නිල කාමරය හා නගර ශාලාව අලුත්වැඩියා කිරීම සිදුකර තිබුණි.

3.4 **සේවක පුරප්පාඩු හා අතිරික්ත**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 30 ක් පැවති අතර, සේවකයින් 122 දෙනෙකු අතිරික්තව සේවයේ යොදවා තිබුණි.

3.5 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වර්ෂ පහෙන් පහට බදු කුලිය තක්සේරුකර, ගිවිසුම් ඇති කරගත යුතු වුවත්, කඩ කාමර 481 ක් සඳහා 1987 වර්ෂයේදී සිදුකල තක්සේරුව පදනම් කරගනිමින් කුලිය අයකර තිබුණි. වර්ෂ 30 ක කාලයක් තුල චක්රලේඛය ප්‍රකාරව කඩ කාමර කුලිය තක්සේරු කර අයකර නොතිබුණි.

3.6 **වත්කම් කළමනාකරණය**

------------------------------

3.6.1 **නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

(අ) සභාව සතු වර්ෂ 06 කට වඩා පැරණි තක්සේරු වටිනාකම රු.765,000 ක් වූ යතුරුපැදි 03 ක් හා ට්‍රැක්ටර් රථ 09 ක් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීම හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.7 **හඳුනාගත් පාඩු**

------------------

2016 ජුනි 17 දිනැති අංක 06/2016 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ටෙන්ඩර් කැඳවීමේදි ආපසු නොගෙවන ලංසු මුදල රු.12,500 ක් වුවත්, බදුල්ල සේනානායක පිටියේ භූගත රථගාල ඉදිකිරිම සඳහා ආයතන පහකින් රු. 2,500 බැගින් අයකර තිබීම හේතුවෙන් ආපසු නොගෙවන ලංසු මුදල් රු. 50,000 ක් අඩුවෙන් අයකර තිබුණි.

3.8 **ප්‍රසම්පාදනය**

-------------------

3.8.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.8.2 **කොන්ත්‍රාත් පරිපාලනය**

----------------------------

පහත කරුණු නිරික්ෂණය විය.

(ආ) බදුල්ල සේනානායක පිටියේ රථගාල රු. 75,147,363 ක ඇස්තමේන්තුවක් මත ඉදිකිරීමේදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවක් පත්කර නොතිබුණු අතර, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ආරම්භක පරිසර පරීක්ෂණය, පාරිසරික බලපෑම පිළිබඳ තක්සේරුව, සමාජ බලපෑම පිළිබඳ තක්සේරුව සහ ව්‍යාපෘතියට අදාල පෙර සුදානම් වීමේ කටයුතු සිදුකර ඇති බව සනාථ කර නොතිබුණි.

(ආ) සේනානායක පිටියේ භූගත රථගාල සඳහා බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සකස් කරන ලද ඇස්තමේන්තුව අනුව ප්‍රාරම්භක වියදම් හා පොළොව සැකසීම හා කැනීමේ කටයුතු සඳහා රු. 1,392,229 ක් ඇතුළත් කර තිබුණද රු. 3,819,184 ක පිරිවැයක් දරා තිබුණි. ශ්‍රී ලංකා යුධ හමුදාවේ ශ්‍රම දායකත්වය හා යන්ත්‍ර සූත්‍ර යොදාගෙන 2014 අප්‍රේල් 02 දින වනවිටත් පොළොව සැකසීමේ කටයුතු පමණක් සිදුකර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. නැවත එම කාර්ය සඳහාම පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත්කරුවකු වෙත රු. 326,700 ක් ගෙවා තිබුණු අතර, මේ සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8:14:1 අනුව ගිවිසුම් ගත දිනට පසුව අනුමත දින දීර්ඝ කර ගැනීමකින් තොරව ඉදිකිරීම් කටයුතු කරන ආයතන සඳහා ප්‍රමාද ගාස්තු අයකර ගත යුතු වුවත් බදුල්ල ප්ලාස්ටික් මධ්‍යස්ථාන ඉදිකිරීම් කටයුතු අනුමත දිනයන් ඉක්මවා පවත්වාගෙන යාමෙන් ඇති වූ රු. 158,815 ක ප්‍රමාද ගාස්තුව අයකර ගෙන නොතිබුණි.

(ඈ) **බදුල්ල මහ නගර සභාවේ කාර්යාල ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය.**

නගර සභාවේ කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුවේ තාක්ෂණික ඇගයීම් කමිටු තීරණය අනුව රු.23,807,701ක අඩුම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාත්කරු වෙත කර්මාන්තය ප්‍රදානය කළයුතු වුවත් රු.24,005,531 ක මිළක් ඉදිරිපත් කර තිබුණු ආයතනය වෙත ප්‍රදානය කර තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2 අභ්‍යන්තර විගණනය

2017 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර,පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලිනව නොපැවැත්වීම. |
| | | (ii) | ආදායම් ලේඛන නඩත්තු නොකිරිම. |
| (ආ) | වත්කම් හා දේපළ | (i) | වත්කම් ආරක්ෂාව තහවුරු නොකිරිම. |
| (ඇ) | තොග | (i) | ගබඩා තොග පාලන ක්‍රියාවලිය අනුගමනය නොකිරිම. තොග පත්‍ර නඩත්තු නොකිරිම |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ණයගැති ණයහිමි | (i) | උපලේඛන පිළියෙල නොකිරිම. |
| | | (ii) | ලේඛන නඩත්තු නොකිරිම. |
| | | (iii) | කාල විශ්ලේෂණ පිළියෙල නොකිරීම. |
| (ඉ) | සේවක කළමනාකරණය | (i) | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම. |
| | | (ii) | අතිරික්ත සේවකයින් විධිමත් කර නොගැනීම. |
| (ඊ) | ව්‍යාපෘති/කොන්ත්‍රාත් | (i) | ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරිම. |
| | | (ii) | ඉදිකිරීම් සඳහා ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැතිවීම. |
| (උ) | සණ අපද්‍රව්‍ය කළමනාකරණය | (i) | ඝණ අපද්‍රව්‍ය දිරන, නොදිරන හා වෙනත් ලෙස වෙන්කර රැස් නොකිරිම. |
| | | (ii) | මළඅපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ප්‍රධාන ඒකකයක් නොමැතිවීම. |
| | | (iii) | සෝගාතකාගාරයේ අපද්‍රව්‍ය ගංගා වලට මුදාහැරීම. |
| (ඌ) | ප්‍රසම්පාදනය | (i) | ප්‍රසම්පාදන රෙගුලාසි අනුගමනය නොකිරිම. |